# නාට්‍ය පෙළ රසවිඳිමු

පෙර අප ඉගෙනගත් පාඩමේ නාට්‍ය පෙළක් රසවිඳීම පිළිබඳ කතා කළෙමු. කියවා රස විඳීමට වඩා නාට්‍ය පෙළක් නියමාකාරයෙන් රස විඳීමට නම් ක්ෂණිකව ඒ ඒ චරිතවලට ආරෝපණය වී රංගනයේ යෙදිය යුතුය. නාට්‍යයක් යනු සාමූහික ක්‍රියාවලියකි. එබැවින් මෙය තනිව කළ නොහැක. එබැවින් නාට්‍යක් මිතුරන් හෝ ඔබගේ සමීප අයවලුන් සමග නිරූපණය කළ හැක. මෙකී නිරූපණ ක්‍රියාවලිය තුළින් නාට්‍යක් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඔබට ලැබෙනු ඇත.

උදා :



- නාට්‍ය පෙළෙහි ඇති සිදුවීම් පිළිබඳ දැනුමක් ලැබීම.
- කතා පුවතක් නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව වැඩිදියුණු වීම.
- නාට්‍යෝචිත අවස්ථා පිළිබඳ අවබෝධයක් ලැබීම.
- කතා වස්තුව කතන්දරයකට වඩා වෙනස් බව අවබෝධ කරගැනීම.
- කතා වස්තුවේ ඇති නාට්‍යෝචිත අවස්ථා වඩා හොඳින් පෙළ ගස්වා ගැනීම.

පුංචි අපට දැන් තේරෙයි, අමර ගියා දිව්‍ය ලෝකේ ආදී නාට්‍ය අධ්‍යනය කිරීමෙන් ඒ බව මනාව අපට පසක් වේ.

1998 වසරේ දී සෝමලතා සුබසිංහ නාට්‍යවේදිනිය විසින් රචනා කර නිෂ්පාදනය කරන ලද පුංචි අපට දැන් තේරෙයි ළමා නාට්‍ය දරුවන්ගේ නොමද ප්‍රසාදයට ලක් වී ඇත. ළමා සිත පිනවන ආකාරයට, චිත්ත රූප මැවෙන ආකාරයට, රිද්මයානුකූල භාෂා ශෛලියකින් ඇය මෙම නාට්‍ය රචනා කර ඇත. ළමා ලෝකයේ සුන්දරත්වය ඉස්මතු වන පරිදි සත්ව චරිත ප්‍රධාන කරගෙන මෙම නාට්‍ය ඉදිරිපත් කරයි. ඉතා කම්මැලි මී හාමිලා හතරදෙනෙකු හා කඩිසර කුකුළු හාමී කෙනෙකු ප්‍රධාන කරගෙන මෙම නාට්‍ය ගලා යයි.

මෙම නාට්‍ය යුගලයේ මිනිස් චරිත මෙන්ම සත්ව චරිතද ඇති හෙයින් සම්මානනීය නාට්‍ය යුගලයකි. මේවා ළමා නාට්‍ය වුවද ලබා දෙන ආදර්ශය සියලු දෙනාගේ ජීවිත සාර්ථක කරගැනීමට උපකාරී වන ගැඹුරු දාර්ශනික කියමන් අන්තර්ගතය.

මීට අමතරව ඔබට හමුවන නාට්‍ය පිටපත් හෝ ඔබ නරඹන නාට්‍යක පිටපත් පෙර අපි සාකච්ඡා කළ ආකාරයට කියවීමෙන් වඩා හොඳ අවබෝධයක් මෙන්ම දැනුමක්ද ලැබෙනු ඇත.

**පැවරුම :**

**සෝමලතා සුබසිංහ නාට්‍යවේදිනිය විසින් රචිත පුංචි අපට දැන් තේරෙයි ළමා නාට්‍යයෙහි කතා වස්තුව චිත්‍ර මාධ්‍යයෙන් ඉදිරිපත් කරන්න.**